# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2145/48 - 2019 ඔක්තෝබර් මස 16 වැනි බදාදා - 2019.10.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 2 දරන දිවිනැගුම (සංශෝධන) පනත මගින් සංශෝධිත 2013 අංක 1 දරන සමෘද්ධි පනත**

8 වන වගන්තිය යටතේ නියමය

2017 අංක 2 දරන දිවිනැගුම (සංශෝධන) පනත මගින් සංශෝධිත 2013 අංක 1 දරන සමෘද්ධි පනතේ 8 වන වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය දයා ගමගේ වන මම, මේ නියමයෙන් අංක 1844/69 හා 2014 ජනවාරි මස 10 වැනි සිකුරාදා දින පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ උපලේඛනයෙහි සඳහන් කර ඇති පහත I වන උපලේඛනයේ සඳහන් පරිපාලන කලාප වෙනුවට, ඉහත පනතේ විධිවිධාන කාර්යක්ෂම ලෙස නිසිපරිදි ක්‍රියාත්මක වීම සහතික කිරීමේ කාර්යය සඳහා, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිපාලන කලාප පිහිටුවමි.

දයා ගමගේ,
ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

**I වැනි උපලේඛනය**

| *කලාප අංකය* | *දිස්ත්‍රික්ක* |
|---|---|
| 1. | කොළඹ, කළුතර, රත්නපුර, ගාල්ල, මාතර |
| 2. | ගම්පහ, කුරුණෑගල, පුත්තලම, කෑගල්ල |
| 3. | මහනුවර, නුවරඑළිය, මාතලේ, බදුල්ල |
| 4. | හම්බන්තොට, මොණරාගල, අම්පාර |
| 5. | අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව |
| 6. | යාපනය, කිලිනොච්චිය, මුලතිව්, වව්නියාව, මන්නාරම |


1A - G 31101 — 22 (2019/10)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## II වැනි උපලේඛනය

| කලාප අංකය | කලාපයේ නම | දිස්ත්‍රික්ක |
|---|---|---|
| 1 | කොළඹ, කළුතර කලාපය | කොළඹ, කළුතර |
| 2 | රත්නපුර - කෑගල්ල කලාපය | රත්නපුර, කෑගල්ල |
| 3 | ගම්පහ - කුරුණෑගල කලාපය | ගම්පහ, කුරුණෑගල |
| 4 | ගාල්ල - මාතර කලාපය | ගාල්ල, මාතර |
| 5 | මහනුවර - මාතලේ කලාපය | මහනුවර, මාතලේ |
| 6 | නුවරඑළිය - බදුල්ල කලාපය | නුවරඑළිය, බදුල්ල |
| 7 | හම්බන්තොට - මොණරාගල කලාපය | හම්බන්තොට, මොණරාගල |
| 8 | අම්පාර - මඩකලපුව කලාපය | අම්පාර, මඩකලපුව |
| 9 | අනුරාධපුර - පොලොන්නරුව කලාපය | අනුරාධපුර, පොලොන්නරුව |
| 10 | යාපනය - කිලිනොච්චිය කලාපය | යාපනය, කිලිනොච්චිය |
| 11 | ත්‍රිකුණාමලය - මුලතිව් - වව්නියාව කලාපය | ත්‍රිකුණාමලය, මුලතිව්, වව්නියාව |
| 12 | පුත්තලම - මන්නාරම කලාපය | පුත්තලම, මන්නාරම |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.